**ප්‍රියංකා රත්නායක**
ප්‍රතිපත්ති සැලසුම් අංශය
පරිසර අමාත්‍යාංශය

# ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වයට ඇති වී ඇති තර්ජන

මිහිමත ජෛව විවිධත්වය වු කලි අවුරුදු බිලියන හතරකට ආසන්න කාලයක් තුළ සිදු වු පරිනාමයේ ප්‍රතිඵලයකි. දැනට පවත්නා ජෛව විශේෂයන් ඇස්තමේන්තුවලට අනුව මිලියන 2 සිට 100 දක්වා ප්‍රමාණයක් වන අතර, මෙයින් මිලියන 1.7 ක ප්‍රමාණයක් පමණ ලේඛණගතව ඇත. මෙම ජෛව විවිධත්වය සොබාදහම සහ මිනිසා විසින් නිර්මාණය කරන ලද පරිසර පද්ධතිවල පෙළ ගැසීමක් තුළින් දැකගත හැකි වෙයි. මානව ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස අද පෙර නොවු විරූ අනුපාතයකින් ජෛව විවිධත්වය මහා පරිමාණ පරිහානියකට මුහුණ දෙමින් සිටියි. පසුගිය වසර දෙසීයක පමණ කාලය තුළ වනාන්තර විශාල වශයෙන් විනාශ වී ඇත. මේ ප්‍රවනතාව දිගටම පැවතුනහොත් පෘථිවියෙහි දැනට පවතින සියලුම ජෛව විශේෂයන්ගෙන් විශාල ප්‍රමාණයක් 21 වන සියවස මැද භාගය වන විට විනාශ වී යාමට ඉඩ කඩ ඇති බව විද්වතුන්ගේ මතය වී තිබේ. නැතහොත් තිරසාර නොවන ලෙස පහළ මට්ටමකට වැටෙනු ඇත.

ශ්‍රී ලංකාව භූමි ප්‍රමාණයෙන් කුඩා රටක් වුවත් පිහිටීම අනුව වෙනස් දේශගුණික තත්ත්වයන් හා භූමි ලක්ෂණ හේතුවෙන් පුළුල් පරිසර පද්ධති ගණනාවක ව්‍යාප්ත වු වටිනා ජෛව විවිධත්වයක් උරුම වී ඇත. පරිසර පද්ධතීන්වල ඇති විවිධත්වය විශේෂ විවිධත්වයකට මෙන්ම, අපටම ආවේණික වු සත්ව හා ශාක විශේෂ ගනණාවකටම වාසස්ථාන සපයයි' නමුත් ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය ද ඉහත සදහන් ලෙසින් ම සෝදාපාළුවට ලක් වීමේ ප්‍රතිඵලය වඩාත් බැරෑරුම් වන්නේ ලෝකයේ ජෛව ආධාර පද්ධතීන්ගේ ක්‍රියාකාරිත්වය සදහා අත්‍යවශ්‍ය වන්නා වු ජීව විශේෂයන්ගේ හා පරිසර පද්ධතීන්ගේ විනාශයයි'අනෙකුත් ප්‍රතිවිපාකයන් නම් ආර්ථික වටිනාකමකින් යුතු භෝග හා සත්ව විශේෂයන්ට රෝග කාරකවලට හා කාලගුණ විපර්යාසයන්ට මුහුණදීමට සිදුවන විට ''ජාන බැංකු'' ලෙස ක්‍රියාකරන, ආහාර පිණිස වගා කරන ශාකයන්ගේ සහ වන ජෛව විශේෂයන්ගේ විනාශවීමය. ඖෂධීය හා ආර්ථික වටිනාකමකින් යුක්ත විය හැකි බොහෝ ජෛව විශේෂයන් ඒවායේ වටිනාකම හදුනා ගැනීමට පෙරම වඳ වී යාමට පුළුවන. ලෝක ජෛව විවිධත්වයේ ප්‍රධාන භාණ්ඩාගාරයක් බඳු වු දියුණුවෙමින් පවතින රටවල්, මූල්‍යමය හා තාක්ෂණික සම්පත් ඌණතාව නිසා තම දේශීය ජෛව සම්පත් කළමනාකරණය හා සංරක්ෂණය කර ගැනීමට නොහැකි තත්වයක සිටී. මේ හේතුව ජෛව සම්පත් විනාශය වඩාත් තීව්‍ර කරවයි. සංවර්ධිත රටවල් ජෛව විවිධත්වයේ පහළ වැටීමට නිරායාසයෙන් සහය වන්නේ නිවර්තන කලාපීය වනාන්තරවල දැව විසිතුරු මසුන් හා වඳ වි යාමේ තර්ජනයට ලක් ව ඇති ජෛව විශේෂයන්වලට සිත් ඇදගන්නාසුළු වෙළඳපොළක් සැපයීමෙනි. රටක ජෛව විවිධත්වය රැක ගැනීමේ හා කළමනාකරණය කිරීමේ පරම අයිතිය හා පූර්ණ නෛතික බලය රැදී ඇත්තේ රටේ ජාතික ආණ්ඩුවටය. දිගින් දිගටම සිදුවන ජෛව විවිධත්වයේ පිරිහීම කෙරෙහි ඇතිවන ලෝක බලපෑම් නිසා, ජාතික වශයෙන් දරණ ප්‍රයත්නයන්ට ජෛව විවිධත්ව සංරක්ෂණය සදහා

ද්වි පාර්ශවික හා බහු පාර්ශවික මුල්‍යමය ආධාර දීම ද වද වී යාමේ තර්ජනයට මුහුණ පා සිටින ජෛව විශේෂයන්ගේ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ සම්මුතිය (CITES), ජාත්‍යන්තර වැදගත්කමක් ඇති තෙත් බිම් සංරක්ෂණය කිරීමේ සම්මුතිය (RAMSAR) හා 'ජෛව විවිධත්වය සඳහා වන සම්මුතිය' වැනි ජාත්‍යන්තර ගිවිසුම් හා සම්මුතීන් ද ජෛව විවිධත්වය ආරක්ෂා කරගැනීමෙහිලා වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ අධික ජන ඝනත්වය "දිළිඳුකම හා විරැකියාවේ ඉහළ මට්ටම ද කෘෂිකර්මය මත විශාල වශයෙන් යැපීම නිසාද රටේ ජෛව විවිධත්වය මත සැලකිය යුතු පීඩනයක් එල්ල ඇති වී තිබේ. සුවිශේෂ වූ ස්වභාවික පරිසර පද්ධති හා ඒවායේ අඩංගු ජීව විශේෂ විනාශ වී යාමට මඟ පාදන ''වන විනාශය'' භූමි හායනය, (හුණු ගල් කැඩීම, වැලි ගොඩ දැමීම හා මැණික් ගැරීම වැනි කරුණු ලංකාවේ ජෛව විවිධත්වය සම්බන්ධයෙන් මුහුණපාන අතුරු ගැටළු වේ.

ඉතා ප්‍රබල ලෙස කෘෂි කර්මාන්තය මත පදනම් වූ ආර්ථිකයක් ඇති නිසාත් ආහාර, ඖෂධ හා අනෙකුත් දේශීය නිෂ්පාදන සඳහා බොහෝ ශාක විශේෂ මත යැපෙන්නට සිදු වී ඇති නිසාත්, ජෛව විවිධත්ව සංරක්ෂණය ශ්‍රී ලංකාවට විශේෂයෙන් ම වැදගත් වේ. රටෙහි ඇති ශාකවලින් තුනෙන් එකකට වැඩි ප්‍රමාණයක් දේශීය වෙදකම සඳහා ප්‍රයෝජනයට ගනු ලබන අතර ශාක විනාශය හා අසීමිත භාවිතය නිසා මෙම ශාක වර්ග බොහොමයක් වඳ වෙමින් පවතී. රටේ ඇති විවිධත්වයෙන් බහුල සාරවත් පරිසර පද්ධති තුළ වගාකරන ශාකයන්ගේ වන ශාක විශේෂ රැකවරණය ලබති. මේ වනගත ශාකවලින් නියෝජනය කෙරෙන ජාන කිටුව වගා කරන ලද ශාක විශේෂයන්ගේ ජනක ගුණාංග වැඩි දියුණු කිරීමට ඉවහල් කරගතහැකි මහගු සම්පතකි. තවත් වටිනා ජාන සම්පතක් වන්නේ රටෙහි ඇති කෘෂි විශේෂයන් අතර පුළුල් පරාසයක් තුළ විහිදෙන විවිධත්වයන්ය. උදාහරණයක් ලෙස වී පිළිබඳව බලන කළ දේශීය වී ප්‍රභේද 2500 කට වඩා බිහි වී ඇත. මේවා මුළුමනින්ම හඳුනානොගැනීමත් එම ප්‍රභේද මෙන් දර්ශනය වන එහෙත් ගුණාත්මක අතින් පහත් මට්ටමේ ප්‍රභේදයන්වල පැවැත්මට ඉඩහැරීම නිසා මෙම ප්‍රභේදවලින් විශිෂ්ඨ ප්‍රරෝහණ බීජ ලෙස නියෝජනය වන්නේ බීජ වර්ග 1000ක් පමණය. පළතුරු, කෙඳි වර්ග, කුළු බඩු, කිතුල් පැණි, බට හා වේ වැල් වැනි ශාක නිෂ්පාදන, ග්‍රාමීය ජනතාවට මුල්‍යමය ආරක්ෂාව සපයන කුඩා පරිමාණ කර්මාන්ත සඳහා ප්‍රයෝජනයට ගැනෙන අමු ද්‍රව්‍යය වේ. වෙරළාසන්න හා සාගරික පරිසර පද්ධති සතු ජෛව සම්පත්, රටේ සමස්ත ප්‍රෝටීන අවශ්‍යතාවයෙන් 70% ක් සපුරාලන අතර සැලකිය ජනතාවට රැකියා ද සපයයි. ජාතික වනෝද්‍යානවලින් හා අනෙකුත් වන සත්ව රක්ෂිතවලින් ලබන්නා වූ ආදායම් මගින් ජෛව සම්පත සෘජුවම රටේ ජාතික ආර්ථිකයට දායක වන අතර, පරිසර සංචාරක කර්මාන්තය වර්ධනය කිරීමෙහි ලා ඇති උනන්දුව රටේ අනාගතයෙහි සැලකිය යුතු ආදායම් මාර්ගයක් බවට පත්වනු ඇත.

ශ්‍රී ලංකාවේ නිරිත දිග වනාන්තර (තෙත් සදාහරිත වනාන්තර) ජෛව විවිධත්වයෙන් හා රටට ආවේණික විශේෂවලින් වෙසෙසින්ම පොහොසත්ය. එහෙත් මේ වනාන්තර කැබලි වී ගොස් ඇති අතර බරපතල තර්ජනයකට මුහුණ පා ඇත.මේ හේතුවෙන් නිරිත දිග ශ්‍රී ලංකාව ලෝකයේ ජෛව විවිධත්වය පිළිබඳව දැඩි අවධානයක් ඇති ස්ථාන 18 න් එකක් ලෙස නම් කර ඇත. එබැවින් ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්ව සංරක්ෂණය වූ කලී, ජාතික අභිලාෂයන් මෙහෙයවන, මුළු ලොවටම වැදගත් වන්නා වූ ක්‍රියාවකි.